# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.— ඕ. 9/2011.

**ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම භාණ්ඩයක් මත ම වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පැනවීමට සහ ඒ බද්ද එකතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටස සංශෝධනය කිරීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

### I වන කොටස

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද පැනවීම

2. 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන සහ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම භාණ්ඩයක් මත ම, ඒ භාණ්ඩයේ පිරිවැයෙන්, රක්ෂණ ගාස්තුවෙන් සහ නැව් ගාස්තුවලින් (මෙහි මින් මතු මේ කොටසෙහි "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද නම් වූ බද්දක් පනවා අයකර ගනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ මත බද්ද.

3. (1) 2 වන වගන්තියේ සඳහන් කරන ලද යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් පනවා අය කර ගනු ලැබිය යුතු බද්ද 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භවන කාලසීමාව සඳහා සියයට 5.0 ක අනුප්‍රමාණයක වූ බද්දක් ලෙස ගණනය කළ යුතු ය. බද්ද ගණනය කරන ආකාරය.

(2) 2011 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි,

(අ) පිරිසැකසුම් කොට ප්‍රති අපනයනය කිරීමේ කාර්යය සඳහා; හෝ

(ආ) අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් භාවිත කිරීම පිණිස

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක පිරිවැය රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් කිසිදු බද්දක් අය කරනු නොලැබිය යුතු ය.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) එම නියමයේ නිශ්චිතව සඳහන් යම් භාණ්ඩයක්, ඉහත සඳහන් බද්ද ක්‍රියාත්මක කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම නියමයේ නිශ්චිතව සඳහන් යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ සම්බන්ධයෙන් අනුග්‍රාහක අනුප්‍රමාණයක් පනවා අය කිරීමට නියම කරනු ලැබිය හැකි ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව කරනු ලබන සෑම නියමයක් ම—

(i) එම නියමය මත අමාත්‍යවරයා විසින් සිය අත්සන තැබූ වහා ම එම නියමය ක්‍රියාත්මක විය යුතු ය;

(ii) හැකි පහසු ඉක්මනින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය;

(iii) ඉන් පසු හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය; සහ

(iv) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබුවහොත්, එම යෝජනා සම්මතයේ දින සිට බලපවත්වන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු බද්දක් අයකරනු නොලැබිය යුතු බව.

**4.** (1) පහත සඳහන් භාණ්ඩ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:—

(i) (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතේ කාර්යය සඳහා අදාළ සංයෝජිත වර්ගීකරණ විස්තරය හා කේතන ක්‍රමවේද අංක යටතේ නිශ්චිතව සඳහන් කර ඇති විදේශීය මුදල් නෝට්ටු ;

(ii) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, විදේශීය ආධාර මත ශ්‍රී ලංකාවේ දී පවත්වන ලද ජාත්‍යන්තර ඉසව්වල දී භාවිත කිරීම සඳහා වූ භාණ්ඩ ;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කළ පරිදි රජයේ අමාත්‍යාංශවලට සෘජුව ලැබුණ පරිත්‍යාගවලින් සිදු කරන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ යම් ව්‍යාපෘතියක් සඳහා වන භාණ්ඩ ;

(iv) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද විදේශීය ණය මුදල්වලින් අරමුදල් සපයන ලද සහ රජය විසින් බදු ගෙවීම දරන ලද යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා වූ භාණ්ඩ ; සහ

(v) 3 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් බද්දෙන් නිදහස් කළ භාණ්ඩයක් ලෙසින් ප්‍රකාශයට පත් කරනු ලබන වෙනත් යම් භාණ්ඩයක්.

(2) 2 වන සහ 3 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් ගැසට් පත්‍රයේ පළ කරන ලද යම් නියමයක් මගින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හඳුනාගත්, රජය විසින් බදු මුදල් ගෙවීම දරනු ලබන, යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම පිණිස යම් භාණ්ඩයක් ආනයනය කිරීමේ දී එසේ ආනයනය කළ භාණ්ඩය සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය වන සමාගම් ඇපකරයක් සැපයීමට යටත්ව, ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ වීමෙන් පසුව ඒ භාණ්ඩය ප්‍රතිඅපනයනය කරන තෙක් වූ කාලය දක්වා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2009 ජූලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, බදු මුදල් එකතු කිරීම විලම්භනය කරනු ලැබිය යුතු ය.

බද්ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවිය යුතු බව.

**5.** ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩයක් මත 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා විසින්, භාණ්ඩය ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු අතර, එසේ බද්ද ගෙවීමේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු වශයෙන් අයකර ගනු ලැබූ මුදල සඳහන් කරමින් ඒ භාණ්ඩයට අදාළ ආනයන ඇණවුම් පත්‍රයේ පිටසනක් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

ඇතැම් භාණ්ඩ මිල දී ගැනීම මේ පනතේ කාර්ය සඳහා ආනයනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**6.** ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ:—

(අ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ ගෙවිය යුතු හෝ ගෙවනු ලැබිය යුතු යයි සලකනු ලැබිය යුතු වූ, යම් රේගු බද්දක්, අධිභාරයක් හෝ වෙනත් අය කිරීමක් අයකර ගැනීම සඳහා හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනයක් සම්බන්ධයෙන් යම් භාණ්ඩයක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විකුණනු ලැබූ අවස්ථාවක ; හෝ

(ආ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඒ පනත යටතේ යම් ගාස්තු අයකර ගැනීම සඳහා යම් භාණ්ඩයක් විකුණනු ලැබූ අවස්ථාවක; හෝ

(ඇ) තමා විසින් පරිපාලනය කරනු ලබන බදු කිසිවක් වෙනුවෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් භාණ්ඩයක් විකුණනු ලැබූ අවස්ථාවක ;

ඒ භාණ්ඩය මිළ දී ගනු ලබන තැනැත්තා 5 වන වගන්තියේ කාර්යය සඳහා ඒ භාණ්ඩය ආනයනය කරනු ලබන තැනැත්තා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නිදහස් කිරීම.

**7.** 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රාජ්‍යයක දූත මණ්ඩලයක් විසින් හෝ යම් සංවිධානයක් විසින් යම් සේවාවක් සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 2 වන වගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

**8.** බද්ද අයකර ගැනීමේ කාර්යය සඳහා සහ මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද එම බද්ද, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ අයකර ගත යුතු රේගු බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ බද්ද අයකර ගැනීම සම්බන්ධයෙන් (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

බද්ද අයකර ගැනීම සඳහා රේගු ආඥාපනත අදාළ විය යුතු බව.

**9.** බදු මුදල් වශයෙන් මේ පනත යටතේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයකර ගනු ලබන සියලු මුදල්, ඔහු විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

බදු වශයෙන් අයකර ගනු ලබන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු බව.

**10.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ "භාණ්ඩය" යන්නෙන් යම් බඩු, ද්‍රව්‍ය, විදේශීය මුදල් නෝට්ටු, යම් කෘෂිකාර්මික හෝ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදනයන් හෝ වාණිජ භාණ්ඩ අදහස් වන නමුත් සකස් කොට නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන දියමන්ති, මැණික්, රත්රන්, ස්වර්ණාභරණ සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ඊට ඇතුළත් නොවේ.

අර්ථ නිරූපණය.

**11.** (1) මේ පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (1) වන ඡේදයේ විධිවිධාන සියලු කාර්යය සඳහා 2010 ජුනි මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

(2) මේ පනතේ 4 වන වගන්තියේ (i) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ විධිවිධාන 2010 මැයි මස 12 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (iii) වන ඡේදයේ විධිවිධාන 2010 සැප්තැම්බර් මස 8 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ විධිවිධාන 2010 ජනවාරි මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම.

**12.** මේ පනතේ විධිවිධාන සියලු කාර්යයන් සඳහා 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

වගකීමෙන් මුක්ත කිරීම.

**13.** 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව සහ මේ පනත ආරම්භවන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යම් භාණ්ඩයක් ආනයනය කරන තැනැත්තකුගෙන් ඒ භාණ්ඩයේ පිරිවැයෙන්, රක්ෂණ ගාස්තුවෙන් සහ නැව් ගාස්තුවෙන් මේ පනතේ 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සියයට පහකට සමාන මුදලක් එකතු කරන අවස්ථාවක දී ඒ එකතු කිරීම සියලු කාර්යයන් සඳහා වලංගු ලෙස සිදු කර ඇති බව හා කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමට එරෙහිව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතු ය.

නියෝග.

**14.** (1) නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටස සංශෝධනය කිරීම.

**15.** 2002 අංක 11 දරන මුදල් පනතේ (I වන කොටස) 2 වන වගන්තියේ (ඈ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තියේ පළමු වන අතුරු විධානය මෙයින් සංශෝධනය කරනු ලැබේ— 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඈ) 2009 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භවන 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 5.0 ක අනුප්‍රමාණයක් වූ බද්දක්.".

**16.** වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද ගෙවීමට අදාළව 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ විධිවිධාන 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව, ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන සහ ශ්‍රී ලංකාවට ආනයනය කරන කිසිදු භාණ්ඩයකට අදාළ කර නොගත යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. 2002 අංක 11 දරන මුදල් පනත අදාළ කර නොගත යුතු බව.

**17.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.